දැඩි කතෝලික විශ්වාසයෙන් සිටි. මේ පවුල කිසිදු විටක රාත්‍රී ආහාරයෙන් පසු රූපවාහිනිය හඹා ගියේ නැත. සිය දරුවන් සමග ගත කිරීමට ඒ කාලය යොද ගත්තට අමතක කලේ නැත. දරුවත් කොහේ ද..? කා සමග ද?.. මව් පිය දෙපළගේ නිරන්තර සිතුවිල්ල වූයේ එය යි.

'මට අදත් විශ්වාසයි ඔවුන් දෙවියන් වහන්සේ සමග දිව්‍ය ලෝකයේ ඇති. ඒ සිතුවිල්ල තුළ මට දරුවන් නැති දුක දුරු කර ගන්න පුළුවන්' යැයි සින්ඩි සඳහන් කරයි.

කෘත්‍රිම පාදයක ආධාරයෙන් සිය ජීවිතයට මුහුණ දෙන ඇෂ්ලිගේ මුළු ජීවිතය ම මව නොමැති පාළුවෙන් පිරී ඇත. දිනක් ජූන් බොතිත්ගේ සොහොන වෙතට ගිය ඇෂ්ලි සහ මැක්ස් එම ස්ථානයේ සමාධිගතව සිටි අතර එක්වනම ඇෂ්ලිගේ දෙනෙත තුළ වූ කඳුළු මැක්ස්ගේ නෙත ගැටිණ.

"මං ඔබට කිවා නේද දුව..අඩන්න දෙයක් නෑ."

"ඒක ඇත්ත. අම්මා දිව්‍ය ලෝකයේ ඇති. ඒත් තවමත් අම්මා අපි ගැන දුකින් ඇති".

අනතුරට පත්වූ මිතුරු හිතවත්කම් සදහන වීම පිණිස මෙම ස්ථානයේ පල්ලියක් ඉදි කිරීමට තීරණය විය. මෙය වේදනාවේ සිහිවටනයක් ලෙසින් නොව මිනිස් ජීවිතයන්හි සුභ සාධනයන් වෙනුවෙන් යාච්ඤා කිරීමේ ස්ථානයක් ලෙසින් ද යොද ගැනිණ.

කාත්කාකි ගංගා නිම්නයේ දුම්රිය අනතුරෙන් මිය ගිය උදවිය වෙනුවෙන් වූ සිහිවටන සඳහා මුදල් වැය කිරීමට කිසිවෙක් මැලිවූනේ නැත. මෙම මගීන්ගේ මිය යෑම අවාසනාවන්ත යැයි හංවඩු ගැසුවේ නැත. අද එය "මරු දුටු රිය"ලෙසින් හඳුන්වාදීම මිස එම ස්ථානයේ නම හෝ සඳහන් කරන්නේ නැත.

බෝබනාසීස් නගරාධිපති ග්‍රෝවර් බෘක් මෙසේ සඳහන් කරයි.

"මේ අනතුරෙන් මිය ගිය දරුවන් දැන් අපේ ය. දුම්රියේ ගමන් කළ සෑම දෙනා ම අපේ ජීවිතයේ කොටස් කරුවන් ය. මේ ශෝකාන්තය අපේ ඉතිහාසයේ තවත් එක් කොටසකි". ❑

**පුනයා චාන්දනී ද සිල්වා**

# ඇන්ත්‍රැක්ස් පරීක්ෂාව සිදුකෙරෙන හැටි

**ඇන්ත්‍රැක්ස් බැක්ටීරියාව සිරුරු ගත වී ඇද්දැයි සොයා ගැනීම සඳහා පරීක්ෂණ ක්‍රියාවලියට දින තුනක් පමණ ගත වේ**

**පිරික්සුම් අදියර** | **උපරිම කාලය** | **අවම වේලාව**



**අවට පරිසරයෙන් හා මිනිස් සිරුරේ නාසික නාළ තුළින් ගත් කොටස් රැස් කිරීම**


**රෝග ලක්ෂණ පළ කරන අයගෙන් රුධිර හා කශේරුකා දියර සාම්පල ලබා ගැනීම**

**පළමු රෝපිතය පැය 2-24 ත් අතර. මෙහිදී ඇන්ත්‍රැක්ස් බැක්ටීරියා සාම්පල අනෙක් බැක්ටීරියාවලට වඩා කැපී පෙනෙයි. මෙය ජීවානුහරණය කළ සාම්පලවල දී පහසුවෙන් කළ හැකි සරල එකකි.**

**ග්‍රෑම් මාදිලි පරීක්ෂණය මී. 15 යි. සැකසහිත බැක්ටීරියා මාදිලි අන්වීක්ෂයකින් පිරික්සනු ලැබේ. නිල් පැහැ ගැන්වුණහොත් ඒවා ඇන්ත්‍රැක්ස් ලෙස හඳුනාගෙන පරීක්ෂණ ඉදිරියට ගෙන යා හැක.**

**දෙවැනි රෝපිතය පැය 24-48 ත් අතර මෙහි දී සැක කරන සාම්පලය වැඩි වර්ධනයකට යොමු කෙරේ. බැක්ටීරියා ඇත්නම් දිගු කාලයක් ගත වේ.**

**පැය 2ක ජෛව රසායන පරීක්ෂණ බැක්ටීරියාවලට රසායනික එකතු කිරීමෙන් විශේෂ රසායනාගාරයක කළ යුතු පිරික්සුම්වලින් ඇන්ත්‍රැක්ස් බව තහවුරු කර ගත හැකි ය.**




**රොයිටර් ඇසුරෙනි**

## *නවයුගය රූප පෙරහර පිළිතුරු*

*22 පිටුවෙන්*

1. යෝධ පැන්ඩා - ලෝක වනජීවී අරමුදලේ ලාංඡනය
2. ක්‍රිකට්
3. අමීර් ඛාන්
4. මොහොමඩ් කටාමි
5. 4 යි.

* ශ්වසන පද්ධතිය (Inhalation) ආසාදනයෙන්
* සම (Cutaneous) අසාදනයෙන්
* බඩවැල (Intestinal) ආසාදනයෙන්
* ග්‍රසනිකාවේ උඩ කොටස සහ ග්‍රීයව අවට (Oropharyngeal) ආසාදනයෙන්

6. දෙව්යානි රානා
7. සභානා පින්ටුසෙව්ච් (යුක්රේනය)
8 අගහරු